## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2011 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 මැයි 24 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇත බවටත්, සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 112,621,937 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,309,935 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,870,143 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 1,880 | 1,816 | 221 |
| (ii) | බදු කුලී | 2,627 | 266 | 106 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 715 | 695 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,014 | 10,781 | 1,581 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාසතු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 2,000,000 |
| (ii) මුද්දර ගාස්තු | 4,000,000 |

### 2.2.3 කඩ, නිවාස හා ගොඩනැගිලි කුලි

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 දෙසැම්බර් 31 දිනට හිඟව තිබූ රු. 70,743 ක කඩ, නිවාස හා ගොඩනැගිලි කුලී ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාව සතු තේ ඉඩම බදු දීමෙන් වර්ෂ කිහිපයක සිට අය විය යුතු රු. 34,935 ක බදු කුලී අය වී නොතිබුණි.

2.2.4 ජල ගාස්තු

----------------

2011 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු රු. 1,581,085 ක් ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු

-------------------------------------

සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර 03 ක පරිසර ආරක්ෂණ බලපත්‍ර කාලය ඉකුත් වී තිබුනද, විගණන දිනය වූ 2011 දෙසැම්බර් 15 වන දින වන විටත් නව බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය